# භාෂාව හා සංගීතය

"භාෂාවෙන් ප්‍රකාශ කළ නොහැකි දෑ සංගීතයෙන් ප්‍රකාශ කළ හැකි බැවින් භාෂාව නැවතුණ තැන සංගීතය පටන්ගන්නේ යැයි කිසිවකු සඳහන් කරනු ඇත. එහෙත් සංගීතඥයන් ගේ අවාසනාවකට මෙන් මෙය ද නිවැරැදි ප්‍රකාශයක් නො වෙයි. එයට හේතුව එවැනි අර්ථයකින් වුව ද භාෂාව සංගීතය නැවතුණ තැනින් පටන් ගන්නේ යැයි ද කීමට යමකුට හැකි බැවින් ය."

මනස පිළිබඳ අපේ ප්‍රවාදයක් ගොඩනගන්නකුට ප්‍රයෝජනවත් විය හැකි තවත් අදහස් කිහිපයක් දැක්වීමට පෙර භාෂාව හා සංගීතය පිළිබඳ අප සඳහන් කළ කරුණක් තවදුරටත් සාකච්ඡා කිරම වැදගත් යැයි සිතමි. භාෂාව හා සංගීතය ද අනෙක් දෑ මෙන් ම මිනිසා ගේ නිර්මාණ වෙයි. භාෂාව මූලික වශයෙන් ම අදහස් ප්‍රකාශය සඳහා යොදා ගැනෙන්නකි. ඇතැම් විට එහි දී යමකු තමාට ම අදහස් ප්‍රකාශ කරනු විය හැකි ය. සංගීතය ද ඇතැම් විට අදහස් ප්‍රකාශ කිරමෙහිලා යොදා ගැනෙයි. එහෙත් සංගීතයෙහි රස විඳීමක් ද වෙයි. මෙයින් කියැවෙන්නේ විද්‍යාවෙහි රස විඳීමක් නැතැයි යන්න නො වෙයි. රස විඳින්නේ කුමක් ද යන ප්‍රශ්නය ද මෙහි දී පැන නගියි. සංගීත ඛණ්ඩයක් රස විඳීමට නම් ඒ තේරුම්ගත යුතු ද යන ප්‍රශ්නය යමකුට ඇසිය හැකි ය. එහෙත් ඒ සමග තේරුම් ගැනීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන ප්‍රශ්නය ඇසීමට සිදු වෙයි.

අප තේරුම්ගන්නේ භාෂාත්මක දේ පමණ ද? භාෂාව නිර්මාණය කිරමට පෙර ගුහාවක අඳින ලද චිත්‍රයක් මිනිසුන් විසින් තේරුම් ගනු ලැබී ද? එසේ නම් ඒ තේරුම් ගනු ලැබුයේ කෙසේ ද? ගුහාවක අඳිනු ලැබූ සතකුගේ රූපයක් අහවල් සතාගේ රූපයක් ලෙස චිත්‍ර ඇඳි තැනැත්තාත් නැරඹූ අයත් තේරුම් ගන්නට ඇත. මෙහි දී තේරුම් ගැනීම යන්න යොදාගැනෙන්නේ හැඳිනගැනීම යන අර්ථයෙන් ය. චිත්‍රයක් ඇඳීමෙන් මුල දී කිසියම් අයකු කුමක් බලාපොරොත්තු වී දැයි හරි හැටි කීමට නො හැකි ය. ඇතැම් විට ඒ රස විඳීමක් ද විය හැකි ය. සතකු ගේ චිත්‍රයක් හැකිතාක් දුරට සතාට සමාන වන ලෙස, සතා නිරූපණය වන ලෙස ඇඳීමෙන් යමකුට තෘප්තියක්, ආස්වාදයක් ලැබුණා විය හැකි ය.

කෙසේ හෝ කලාවෙහි රස වින්දනයක් ඇති බව පැහැදිලි ය. කලාවෙහි පමණක් නො ව ගණිතයෙහි ද රස වින්දනයක් වෙයි. ඇතැම් ගණිත ප්‍රමේයයන්හි සාධන ඉතා රසවත් වෙයි. රස විඳීම, තේරුම් ගැනීම ආදිය ඒ ඒ ක්ෂෙත්‍රවල අඩු වැඩි වශයෙන් පවතියි. ඇතැම් විට තේරුම් ගැනීමක් වුව ද රස විඳීමක් විය හැකි ය. ගණිතයෙහි හෝ විද්‍යාවෙහි හෝ ඒ බටහිර වුව ද වෙනත් යමක් වුව ද, අලුත් ප්‍රතිඵලයක් ලබාගන්නා අයකුට මහත් වින්දනයක් ලැබෙයි. අපේ භාවාත්මක හැඟීම් ඒ ඒ ක්ෂෙත්‍රයෙහි, හැඟීම් අතර ම බැඳී ඇති බැවින් ඇතැම් විට එක් හැඟීමක් අනෙක් හැඟීමකින් වෙන් කර හඳුනා ගැනීමේ අපහසුවක් ද වෙයි.

මේ අතර ඒ හැම ක්ෂෙත්‍රයක ම දේශපාලනයක් ද තිබෙන බව අමතක නො කළ යුතු ය. හුදු කලාවක් හෝ හුදු විද්‍යාවක් හෝ ලෝකයෙහි කිසිම තැනක තිබිය නො හැකි ය. හුදු කලාවක් තිබිය හැක්කේ හුදකලාවක් ලෙස ය. එහෙත් මෙලොව කිසිවකුට, ආරණ්‍යගත ව සිටින්නකුට වුව ද මුළුමනින් ම හුදකලා විය නොහැකි ය. අප බටහිර විද්‍යාවක්, බටහිර දැනුමක් ආදී වශයෙන් පවසන්නේ ඒ සියල්ල බටහිර නූතනත්වයෙහි ප්‍රතිඵල ලෙස සලකමින් ය. ඒ කිසිවක් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙන් ස්වායත්ත නො වෙයි. මුළු මහත් බටහිර විද්‍යාව ම අවසාන විග්‍රහයෙහි දී බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය සමග බැඳී ඇත. අප බටහිර විද්‍යාව ඉගෙන ගත යුත්තේ ඒ බව ද සැලකිල්ලට ගනිමින් ය.

බටහිර විද්‍යාවටත් වඩා බටහිර ඇතැම් කලා නිර්මාණ හා ඒ ආශ්‍රිත ව කෙරෙන මෙරට ඇතැම් කලා නිර්මාණ ඇතැම් අවස්ථාවල මූලික වශයෙන් දේශපාලන කෘති බවට පත් වෙයි. එවැනි ඊනියා කලාකෘති බටහිර සංස්කෘතික යටත්විජිතවාදය ප්‍රචලිත කිරම සඳහා යොදාගැනෙන විට අප ඒවාට සැලකිය යුත්තේ වෙනත් දේශපාලන මාතයකට (පදා;-, ක්‍රමවේදයකට සලකන අයුරින් ය. අපි මෙරට ස්වාධීනත්වය නැසීමට එන බටහිර හමුදා සේනාංකයක් තොරන් බැඳ නො පිළිගන්නෙමු. අප කරන්නේ ඒ සේනාංකය පළවා හැරිම ය. එයට පහර දීම ය. බටහිර ක්‍රිස්තියානි

© Prof. Nalin De Silva

සංස්කෘතික යටත්විජිතවාදය ප්‍රචලිත කිරම සඳහා නිර්මාණය කෙරෙන ඊනියා කලා කෘති සම්බන්ධයෙන් ද අප ක්‍රියා කළ යුත්තේ එපරිදි ය.

සංගීතය භාෂාවට පෙර නිර්මාණය වී යැයි අප කලින් සඳහන් කර ඇත. වචනයක් උච්චාරණය කිරම යනු යම් ශබ්ද රටාවක් නිර්මාණය කිරම ය. ඒ ශබ්ද රටාව තරමක් සංකීර්ණ වෙයි. මිනිසුන්ට ඉතා පහසු කිසි ම රටාවක් නැති ශබ්ද නිර්මාණය කිරම ය. කිසි ම රටාවක් නැති තැන ඇත්තේ ඝෝෂාවක් පමණ ය. ශබ්දය යම්කිසි රටාවකට පිට කෙරෙන විට, නිර්මාණය කෙරෙන විට, අපි එයට සංගීතය යැයි කියමු. සරල සංගීත ඛණ්ඩයක ඇති ශබ්ද රටාවට වඩා සංකීර්ණ ශබ්ද රටාවක් වචනයක් උච්චාරණය කිරමේ දී නිර්මාණය වෙයි.

සංගීතඥයන් පිළිගැනීමට අකැමැති වුව ද මිනිසුන් භාෂාවක් නිර්මාණය කිරීමට පෙර සංගීතයක් නිර්මාණය කළ යුතු ය. ඒ මූලික සංගීතය හා සම්බන්ධ ශබ්ද රටා ගැන සැලකීමෙන් ලබාගන්නා නිගමනයක් වෙයි. අපේ රටේ ප්‍රධාන ම ප්‍රශ්නයක් වී ඇත්තේ වෙනත් රටවලට ද වඩා බුද්ධිමය ක්ෂෙත්‍රයෙහි නායකත්වය කලාව, සාහිත්‍ය වැනි විෂය හැදෑරුවන්ට ලැබී තිබීම ය. විශේෂයෙන් ම ජනමාධ්‍ය ක්ෂෙත්‍රයෙහි සිටින බටහිර විද්‍යාව වුව ද හැදෑරුවන් සංඛ්‍යාව අතේ ඇඟිලි සංඛ්‍යාවට ද වඩා අඩු ය. මේ කලාකරුවන්, සාහිත්‍යකරුවන්, ජනමාධ්‍යවේදීන් බටහිර විද්‍යාව හෝ බටහිර ගණිතය හෝ සාමාන්‍ය පෙළෙන් ඔබ්බට හදාරා නැත. මේ අයට මෙරට සමාජයෙහි ඇති ආධිපත්‍යය හේතු කොටගෙන ම, අද මෙරට එක්තරා ආකාරයක බුද්ධිමය දරිද්‍රතාවක් ද දැකිය හැකි ය. මේ අයට කලාකරුවන්, සාහිත්‍යකරුවන්, ජනමාධ්‍යවේදීන් ආදීන් හැරෙන්නට වෙනත් බුද්ධිමතුන් නැත.

සංගීතඥයන්ගේ අකැමැත්ත අපි නොසලකා හරිමු. මූලික සංගීතයට පෙර භාෂා උච්චාරණය තිබිය යුත්තේ ඇයි ද යන ප්‍රශ්නයට සංගත නිරවුල් පිළිතුරක් දීමට ඔවුන් අපොහොසත් වන තෙක් ඔවුන් මෙරට සමාජයෙහි කෙතරම් බුද්ධිමය ආධිපත්‍යයක් දැරුව ද අපි ඔවුන් ගේ කැමැත්ත අකැමැත්ත ප්‍රතික්ෂේප කරමු. බටහිර ඇතැම්හු යම් සංස්කෘතියක සංගීතය හා භාෂාව අතර ඇති සම්බන්ධකම ගැන හදාරති. අපට කිව හැක්කේ යම් සංස්කෘතියක සංගීතය හා භාෂාව අතර සම්බන්ධයක් තිබිය යුතු බවත්, භාෂා උච්චාරණය ඒ සංස්කෘතියෙහි සංගීත රටා මත පදනම් වන බවත් ය. ඒ අර්ථයෙන් ගත් කල භාෂාව නැවතුණ තැන සංගීතය පටන් ගන්නේ ය, යන්න සංගීතඥයන් ගේ අභිමානය පෝෂණය කරන එහෙත් නිසරු ප්‍රකාශයක් පමණක් වෙයි.

එහෙත් මේ සම්බන්ධයෙන් වෙනත් අර්ථකථනයක් ද දිය හැකි ය. භාෂාව නැවතුණ තැන සංගීතය ආරම්භ වන්නේ ය, යන්න මිනිස් නිර්මාණ විකාශය වී ඇති ආකාරය පෙන්වන කාල රේඛාවක් ලෙස නො ව අදහස් ප්‍රකාශය හා සම්බන්ධ වුවක් ලෙස සැලකිය යුතු යැයි කිසිවකුට කිව හැකි ය. වෙනත් අයුරකින් කිව හොත් භාෂාවෙන් ප්‍රකාශ කළ නොහැකි දෑ සංගීතයෙන් ප්‍රකාශ කළ හැකි බැවින් භාෂාව නැවතුණ තැන සංගීතය පටන්ගන්නේ යැයි කිසිවකු සඳහන් කරනු ඇත. එහෙත් සංගීතඥයන් ගේ අවාසනාවකට මෙන් මෙය ද නිවැරැදි ප්‍රකාශයක් නො වෙයි. එයට හේතුව එවැනි අර්ථයකින් වුව ද භාෂාව සංගීතය නැවතුණ තැනින් පටන් ගන්නේ යැයි ද කීමට යමකුට හැකි බැවින් ය.

ආරම්භයේ දී හුදු ශබ්ද පමණක් නිර්මාණය කළ මිනිසා පසුව සරල ශබ්ද රටා ඔස්සේ සංගීතය නිර්මාණය කරන්නට ඇත. සංගීතයෙහි රස විඳීමක් මෙන් ම අදහස් ප්‍රකාශයක් ද වෙයි. සිංහලයෝ හූ හඬ අදහසක් ප්‍රකාශ කිරීමට යොදා ගනිති. මිනිසුන්ට ඇති වූ මූලික ප්‍රශ්නයක් වන්නේ තමන්ට එන අදහස් අන් අයට ප්‍රකාශ කිරම ය. භාෂාවක් කතා කිරමට පෙර ම ළදරුවෝ තම අදහස් විවිධාකාරයෙන් පළ කරති. ඇතැම් විට එය හැඬීමක් විය හැකි ය. එසේත් නැතිනම් අතින් කරන සංඥාවක් විය හැකි ය. කෙසේ වෙතත් භාෂාවක් දැන ගැනීමට පෙර ළදරුවන්ට මූලික අදහස් ඇති වන බවත් මිනිසුන් මෙහෙයවනු ලබන්නේ භාෂාවෙන් බව පවසන ඊනියා ලැකානියානු මනෝ විශ්ලේෂණය යනු මනස්ගාතයක් ම බවත් පෙනී යනු ඇත.

එහෙත් සංගීතයෙන් නිශ්චිත ව පැහැදිලිව තම අදහස් ප්‍රකාශ කිරමට නොහැකි බව මිනිසුන්ට කල් යෑමේ දී තේරුම් යන්නට ඇත. මිනිසුන් භාෂා නිර්මාණය කිරමට පෙලඹීමට ඒ ප්‍රධාන හේතුවක් වී යැයි සිතිය හැකි ය. අදහස් ප්‍රකාශ කිරීමෙහි ලා සංගීතයට වඩා භාෂාව නිශ්චිත ය. සංගීත ඛණ්ඩයක් වාදනය කරනු අසා සිටින්නන් දෙදෙනෙක් ඔවුන් එක ම සංස්කෘතියකට අයත් වුව ද, බොහෝ විට ඉන් එක ම අදහසක් ලබා නො ගනිති. එහෙත් වාක්‍ය කිහිපයකට

සවන් දෙන ඒ දෙදෙනාට බොහෝ විට එක අදහසක් ලැබෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ දෙදෙනා සැම විට ම භාෂාවේ වාක්‍යවලින් එක ම අදහස් ලබාගන්නා බව නො වෙයි.

සාමාන්‍ය භාෂාව වුව ද නිශ්චිත ව නිරවුල් ව අදහස් සන්නිවේදනය කිරමට අපොහොසත් වෙයි. බටහිර ගණිතය සාමාන්‍ය භාෂාවක ඇති ඒ ඌනතාව නැති කිරිමට උත්සාහ ගනියි. බටහිර ගණිතය ඇතැමුන් විසින් භාෂාවක් ලෙස සැලකෙන්නේ ද එබැවින් ය. ගණිතය භාෂාවක් ලෙස ගත හොත් වෙනත් භාෂාවකට වඩා නිශ්චිත ය. එහෙත් මෙහි දී මතක තබා ගත යුතු කරුණක් නම් බටහිර ගණිතයට වෙනත් භාෂාවකින් තොර ව පැවතිය හැකි නො වන බව ය. බටහිර ගණිතය ප්‍රකාශ කිරමේ දී වෙනත් භාෂාවක ද සහාය එයට අවශ්‍ය වෙයි. සිංහල හෝ දෙමළ හෝ ඉංගිරිසි හෝ වෙනත් භාෂාවක් නොමැති ව ගණිතය ප්‍රකාශ කළ නොහැකි ය.

මිනිසුන් හැකිතාක් නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරමට කැමැත්තක් දක්වන අතර ම අනෙක් පැත්තෙන් තම නිර්මාණශීලිත්වය යොදා ගැනීමට ද අදහස් කරති. ඉන් අදහස් කෙරෙන්නේ එතරම් නිශ්චිත නොමැති ප්‍රකාශනවලට ද මිනිසුන් කැමැති වන බව ය. එසේ නිශ්චිත නො වන ප්‍රකාශයක ඇති වැදගත්කම නම් ඉන් මිනිසුන්ට යම් නිර්මාණශීලීත්වයක් ලැබීම ය. කවියක් (පද්‍යයක්) අර්ථකථනය කළ හැක්කේ එක් අයුරකින් පමණක් නො වෙයි. වචනවල ඇති ව්‍යංගාර්ථ ආදී විවිධ අර්ථ යොදා ගැනීමෙන් කවියක රසවත් බව ද වර්ධනය කළ හැකි ය. කවියක් නිශ්චිත නො වීම නිසා ම එහි ඇත්තේ විසිරුණු එකක් විය හැකි ය. ගද්‍යයට වඩා පද්‍යය විසුරුණු වන අතර සංගීතය (ගීතය නොව) පද්‍යයට ද වඩා විසුරුණු වෙයි. විසුරුණු අදහස් ප්‍රකාශ කිරම සම්බන්ධයෙන් ගත් කල නම් අවශ්‍ය නම් භාෂාව නැවතුණ තැන සංගීතය පටන් ගන්නේ යැයි කීමේ වරදක් නැත.

මෙයින් කියැවෙන්නේ අද වන විට සංගීතය මිනිසාගේ මුල් සංගීතයෙන් වර්ධනය වී සංකීර්ණ වී නොමැති ය යන්න නො වෙයි. සංගීතය මෙන් ම භාෂාව ද සාමාන්‍යයෙන් ගත හොත් වර්ධනය වෙයි. භාෂාව නිශ්චිත වීම සඳහා වෑයම් කරන අතර සංගීතය විවිධාර්ථ ගෙන දීමට උත්සාහ ගනියි. එක් අතකින් ගත් කල සංගීතය සමස්තය ප්‍රකාශ කිරමට උත්සාහ දරන බවත් භාෂාව යම් නිශ්චිත දෙයක් ප්‍රකාශ කිරමේ වෑයමක යෙදෙන බවත් පැවසිය හැකි ය. ඒ අතින් ගත් කල කිව හැක්කේ භාෂාව නැවතුණ තැන සංගීතයත්, සංගීතය නැවතුණ තැන භාෂාවත් පටන් ගන්නා බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva